සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2120

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2019
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-........................................................ විභාග අංකය:-..............................................

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති කරුණු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

( සිරස නමමු, ඛඩප් තාලය, අළුව, අවනද්ධ, සිතාරය සහ එස්රාජය, ඇහැළ මහට, දීප්චන්දි තාලය)

01. බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගී පාදයක් ලෙස .............................................................. ගී පාදය හැඳින්විය හැකිය.

02. "ඨෙකාව" යනු තාලයක ........................................................ පදයයි.

03. ................................................... මාත්‍රා දහයකින් යුත් හින්දුස්ථානි තාල පදය වේ.

04. උතුරු ඉන්දියානු සංගීතයට අයත් පර්දා සහිත ස්වර වාද්‍ය භාණ්ඩ යුගලය වන්නේ ........................................................................... යි.

05. එස්රාජය වාදන සඳහා ............................................ නම් උපකරණය යොදා ගනී.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( ✕ ) ලකුණ ද යොදන්න.

06. සිතාරයේ හා එස්රාජයේ ප්‍රධාන තත සුසර කරනු ලබන්නේ "ම" ස්වරයටයි. (.........)

07. සාමූහික බව දනවන ගැමි ගී විශේෂයක් ලෙස ගැල් ගී හැඳින්විය හැකිය. (.........)

08. හේමමාලී තූර්තියට අයත් ගීතයක් ලෙස අද වෙස්සන්තර ගීතය හැඳින්විය හැකිය. (.........)

09. "කුණ්ඩලකේශී" නාට්‍යයේ "අන්න බලන් සඳ" ගීතයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ සෝමදාස ඇල්විටිගල මහතා විසින් ය. (.........)

10. දෙවියන් වෙනුවෙන් ගයන ලද ගීත හඳුන්වන්නේ රවින්ද්‍ර ගී නමින් ය. (.........)

● ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. නෙළුම් ගී ඇසුරින් නිර්මාණය වී ඇති සරල ගීතයක් වන්නේ,

1. දුනුකෙයියා මලක් වගේ....ගීතයයි.
2. සරුංගලේ වරල් සැලේ....ගීතයයි.
3. තෙල්ගාලා හිස පීරන් නැනෝ ....ගීතයයි.
4. ඈත එපිට ගම්මානෙන්....ගීතයයි.

12. කෙත හා බැඳි ගැමි ගී විශේෂයන්ට අයත් වන්නේ,

1. ගොයම් ගී, පැල් ගී, ගැල් ගී ය.
2. ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී ය.
3. කමත් ගී, පාරු ගී, පැල් ගී ය.
3. නෙළුම් ගී, ගොයම් ගී, ගැල් ගී ය.

13. සරල ගීතයක් වර්ණවත් කිරීම සඳහා යොදා ගනු ලබන කෙටි ස්වර ඛණ්ඩය හඳුන්වනු ලබන නම කුමක් ද?

1. Harmony
2. Counters
3. Chords
4. Bits

14. "චින්න චින ආසෙයි" යන දමිළ ගීතයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

1. A.R රහුමාන් මහතා විසිනි.
2. R. මුත්තු සාමි මහතා විසිනි.
3. ගවුස් මාස්ටර් විසිනි.
4. T.R. පාපා මහතා විසිනි.

15. හින්දුස්ථානි සංගීතය ඇසුරින් නිර්මාණය වූ ගීත විශේෂය වන්නේ,

1. නාඩගම් ගී ය.
2. දමිළ ගී ය.
3. නූර්ති ගී ය.
4. කිතුණු බැති ගී ය.

16. දීප්චන්දි තාලයේ බලිය පිහිටුවා ඇත්තේ කිනම් මාත්‍රාව මත ද?

1. පළමු විභාගයේ පළමු මාත්‍රාව මත ය.
2. තුන්වන විභාගයේ පළමු මාත්‍රාව මත ය.
3. තුන්වන විභාගයේ තුන්වන මාත්‍රාව මත ය.
4. පළමු විභාගයේ හතරවන මාත්‍රාව මත ය.

17. මව්පිය ගුණ වරුණ ගීයක් නොවන්නේ,

1. පියාණනී මා නැවත උපන්නොත්...ගීතයයි.
2. අම්මා සඳකි...ගීතයයි.
3. පිතු සෙනෙහේ පිදූ... ගීතයයි.
4. තැන තැන රවුමට ඉඳගෙන...ගීතයයි.

18. 𝅗𝅥 , ♪ යන බටහිර සංගීත ස්වර සංකේතයන් වලට හිමි මාත්‍රා සංඛ්‍යාව පිළිවෙලින් වන්නේ,

1. 1, 1/2
2. 2, 1/2
3. 4. 1
4. 2, 1

19. "ග, නි" යෙදෙන 'සිරිසාර අති ශාන්ත' යන ස්වර ස්ථාපන ගීතය අයත් රාගය කුමක් ද?

1. බිලාවල්
2. භූපාලි
3. යමන්
4. කාෆි

20. නාඩගම් සඳහා භාවිත වන අවනද්ධ භාණ්ඩයේ නම කුමක් ද?

1. ගැටබෙරය
2. ඩොල්කිය
3. මද්දලය
4. තබ්ලාව

( ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැ. යු:-

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. "ඔබ පංති කාමරයේදී රාගවලට අයත් ස්වර ස්ථාපන ගීත ගායනා කරන්නට ඇති....... ඒ අතරින් කාෆි රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස නිවැරදිව ගීත, ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

    ii. එම ගීත ප්‍රස්තාරයට ගැළපෙන හින්දුස්ථානි තාල පදය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

02. දී ඇති කරුණු ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

- දෙවියන්ගේ ගුණ ගයයි.
- රවින්ද්‍රනාත් තාගෝර් තුමා විසින් නිර්මිත ය.
- එස්රාජය ප්‍රධාන වාද්‍ය භාණ්ඩයයි.
- උත්තර භාරතයෙහි ප්‍රචලිත ය.
- බෙංගාල ප්‍රදේශයෙහි ප්‍රචලිත ය.
- හිංදුස්ථානී තාල පද වාදනය කෙරේ.
- වංග බසින් රචනා කර ඇත.
- මීරාබායි, තුල්සිදාස් වැනි ශිල්පීන්ගේ දායකත්වය ලැබී ඇත.

    i ඉහත ලක්ෂණ ඇතුළත් ඉන්දියානු ගායන ශෛලීන් දෙක කුමක් ද? (ලකුණු 02)

    ii එම ගායන ශෛලීන් දෙකට අනුව ඉහත ලක්ෂණ වෙන්කර දක්වන්න. (ලකුණු 04)

    iii එම ගායන ශෛලීන් දෙකෙන් ඔබ කැමති එක් ශෛලියකට අයත් ගීතයක් ලියන්න. (ලකුණු 06)

03. i දේශීය සංගීත පද්ධතියේ තාල වාද්‍ය භාණ්ඩයක් වන තාලම්පටෙන් වාදනය කළ හැකි ධ්වනි නම් කරන්න. (ලකුණු 02)

    ii තනි තිතේ ප්‍රභේද සහ දෙතිතේ ප්‍රභේද වෙන් වශයෙන් දක්වන්න. (ලකුණු 06)

    iii දෙතිතට අදාළව, ඔබ කැමති බෙරපදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

04. i බටහිර සංගීත ප්‍රස්තාරකරණය අනුව රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර සප්තකය ලකුණු කරන්න. (ලකුණු 07)

    ii මෙම සංකේත හඳුන්වන නම් ලියන්න.

    1 ♩

    2 𝅗𝅥

    3 ♪

    4 𝅘𝅥𝅯

    5 𝅝 (ලකුණු 05)

05. i. නූර්ති සහ නාඩගම් රංග ශෛලීන්වල ලක්ෂණ 3 බැගින් ලියන්න. (ලකුණු 6)

ii නූර්ති ගීයක ස්ථායි කොටසේ පදමාලාව ලියන්න. (ලකුණු 4)

iii නූර්ති සහ නාඩගම් සඳහා දායක වූ සංගීතඥයින් දෙදෙනෙකු පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 2)

06. i. සදැස්මත් හා ගීමත් යන්න හඳුන්වන්න. (ලකුණු 6)

ii. පහත සඳහන් ගී පාදවල සදැස්මත් ගණන සහ ගීමත් ගණන වෙන් වෙන්ව දක්වන්න.

(a) කොබෝ කුරුළු වනේ

(b) බුද්ධං සරණේ සිරස දරාගෙන

(c) උදයට පායන හිරු දෙවියන්ටයි (ලකුණු 6)

07. i. සිතාරය හෝ එස්රාජය යන සංගීත භාණ්ඩ දෙකෙන් කැමති භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් 4ක් ලකුණු කරන්න. (ලකුණු 6)

ii. සිතාරය සහ එස්රාජය භාණ්ඩවල ව්‍යුහයේ ඇති සමානතා 2ක් ලියන්න. (ලකුණු 4)

iii. ලෝක ප්‍රසිද්ධ භාරතීය සිතාර් වාදකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)